# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**2025 අප්‍රේල් මස 17 වන දින**

**II වන කොටස**

**අතිරේකය**

(2025.04.24 දින නිකුත් කරන ලදී)


## සමාගම් (සංශෝධන)

**2007 අංක 07 දරන සමාගම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

**වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී**


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

**මිල : රු. 54.00** **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2007 අංක 07 දරන සමාගම් පනතේ 4 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ තනි කොටස් හිමියකු සමඟ සමාගමක් සංස්ථාගත කිරීම වේ.

***3 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, ස්වකීය නාමය වෙනස් කරනු ලබන අවස්ථාවක දී, ඒ බව මහජනයා වෙත දැනුම් දීම සඳහා වන කාල සීමා දීර්ඝ කිරීම වේ.

***4 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, හාරක සඳහා වූ කොටස් බලපත්‍රයක් හෝ හාරක කොටස් බලපත්‍රයක් නිකුත් කිරීම තහනම් කිරීම වේ.

***5 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට අලුත් 51අ වගන්තියක් ඇතුළත් කරනු ලබන අතර, අලුත් වගන්තියේ නීතිය බලපෑම වනුයේ, හාරක සඳහා වූ කොටස් බලපත්‍රයක් හෝ හාරක කොටස් බලපත්‍රයක් පිළිබඳ තොරතුරු මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තු පනතක් වන දින සිට දින හැටක් ඇතුළත හෙළිදරව් කිරීමේ වගකීම එකී හාරක සඳහා වූ කොටස් බලපත්‍රයක් හෝ හාරක කොටස බලපත්‍රයක් දරන්නා වෙත පැවරීම වේ.

***6 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, කොටස් විභජනයට අදාළ කාල සීමාවලට අදාළ විධිවිධාන සංශෝධනය කිරීම වේ

***7 වන වගන්තිය :*** මේ වගන්තිය මගින්, ප්‍රධාන ප්‍රඥප්තියට -

(අ) කොටස්හිමියකු සහ සමාගමක ලේකම්වරයා හෝ අධ්‍යක්ෂවරයකු විසින් කොටස්වල අර්ථලාභී අයිතිය පිළිබඳ විස්තර හෙළිදරව් කිරීම සහ එකී විස්තර නිශ්චිතව සඳහන් කරනු ලබන තැනැත්තන් සමඟ බෙදා ගැනීම සඳහා;

(ආ) සමාගමක් විසින් සහ රෙජිස්ට්‍රාර්වරයා විසින්, සමාගමක කොටස්වල අර්ථලාභී අයිතිය පිළිබඳ විස්තර අන්තර්ගත වන ලේඛන තබා ගැනීම සහ පවත්වාගෙන යාම සඳහා;

(ඇ) කොටස්වල අර්ථලාභී අයිතියට අදාළව සිදුකරන ලද වැරදි සඳහා ; "අර්ථලාභී අයිතිකරු" සහ "සඵල පාලනය" සඳහා වන අලුත් අර්ථ නිරූපණ සඳහා; සහ

(ඇ) මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තු පනතක් බවට පත්වන දින සිට දින හැටක් ඇතුළත සඵල අයිතිය පිළිබඳව තොරතුරු සමාගමක් හෝ තැන්පතුධාරිකයක් විසින් තොරතුරු ලබා ගැනීම සඳහා,

වන විධිවිධාන ද ඇතුළුව, කොටස්වල "අර්ථලාභී අයිතියට" අදාළ විධිවිධාන අන්තර්ගත අලුත් කාණ්ඩය ප්‍රධාන ප්‍රඥප්තියට ඇතුළත් කරනු ලැබේ.

***8 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 206 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, සමාගමක අධ්‍යක්ෂවරුන් ඉවත් කිරීම සඳහා වන කාර්ය පටිපාටිය නැවත සකස් කිරීම වේ.

***9 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 211 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, වයස අවුරුදු හැත්තෑවට වැඩි අධ්‍යක්ෂවරයකුගේ පත්වීම සම්බන්ධයෙන් සම්මත කරගත් යෝජනාවක වලංගු කාලය ප්‍රතිශෝධනය කිරීම වේ.

***10 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 270 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එයට ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තියට කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

***11 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 272 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එයට ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තියට කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

***12 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 341 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, ගිණුම් විස්තරයේ පිටපතක් සහ සමාගමක් විසුරුවා හැරීමට අදාළව පැවති රැස්වීමක් පැවති බව තහවුරු කිරීමක් රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කිරීම පැහැර හරිනු ලබන ඈවරකරුවකු වෙත වගකීමක් පැවරීම වේ.

***13 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 424 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, ගිණුම් ණයහිමියන්ගේ කමිටුව විසින් නියම කරනු ලබන තොරතුරු එකී කමිටුව වෙත ඉදිරිපත් කිරීම සඳහා අද්මිනිස්ත්‍රාසිකරුට ලබා දී ඇති කාලය දීර්ඝ කිරීම වේ.

***14 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 471 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ දෙපාර්තමේන්තුවේ නව සේවක සංඛ්‍යාවක් ඇති කිරීම වේ.

***15 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ සිංහල පාඨයේ දෝෂයක් නිවැරදි කිරීම සඳහා ප්‍රධාන ප්‍රඥප්තියේ 472 වන වගන්තිය සංශෝධනය කරනු ලබයි.

***16 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 484අ අලුත් වගන්තියක් ඇතුළත් කරනු ලබන අතර, අලුත් වගන්තියේ නීතිය බලපෑම වනුයේ, ඇතැම් ලේඛන සහ තොරතුරු ඉදිරිපත් කිරීම සඳහා සමාගමකට ලබා දෙන කාල සීමාවක් දීර්ඝ කිරීමට රෙජිස්ට්‍රාර්වරයාට බලය ලබා දීම වේ.

***17 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 487 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, නම කපාහරින ලද පවත්නා සමාගමකට, නිශ්චිත කාල සීමාවක් තුළ දී එකී සමාගම නැවත ලියාපදිංචි කිරීම සඳහා සහ රජය සතු කරන ලද එහි දේපළ නැවත පවරාගැනීම සඳහා අවස්ථාවක් ලබා දීම වේ.

***18 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 508 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, ආරාවුලක් සමථකරණය සඳහා යොමු කරන ලෙසට ඉල්ලීමක් කිරීමට පාර්ශ්වයට ඉඩ සැලැස්වීම වේ.

.

***19 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 513අ අලුත් වගන්තියක් ඇතුළත් කරනු ලබන අතර, අලුත් වගන්තියේ නීතිය බලපෑම වනුයේ, සාමාන්‍ය දණ්ඩන සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***20 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 529 වන වගන්තියේ "බෙදා හැරීම" යන යෙදුමේ අර්ථ නිරූපණය සංශෝධනය කරනු ලබයි.

***21 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි පාඨවල දෝෂ නිවැරදි කිරීම සඳහා වන උපලේඛනයක් සඳහා විධිවිධාන සලස්වනු ලබයි.

එල්.ඩී.-ඕ. 61/2024

## 2007 අංක 07 දරන සමාගම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය

**1**. (1) මේ පනත 2025 අංක      දරන සමාගම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) මේ වගන්තියේ විධිවිධාන හැර මේ පනතේ විධිවිධාන, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි යම් දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

(3) මේ වගන්තියේ විධිවිධාන පනත් කෙටුම්පත පාර්ලිමේන්තු පනතක් බවට පත්වන දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

2007 අංක 07 දරන පනතේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2007 අංක 07 දරන සමාගම් පනතේ 4 වන වගන්තිය, එහි (2) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට, පහත කොටස ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(2) ඇපයෙන් සීමිත සමාගමක් හැර, සමාගමක-

(අ) ස්වභාවික තැනැත්තකු;

(ආ) සංස්ථාවක්; හෝ

(ඇ) ශ්‍රී ලංකාවේ ආණ්ඩුව වෙනුවෙන් කොටස් දරන භාණ්ඩාගාරයේ ලේකම්වරයා,

විය හැකි තනි කොටස් හිමියකු සිටිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම

**3**. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය, එහි (5) වන උපවගන්තියේ "වැඩ කරන දින දහයක්" යන වචන වෙනුවට "වැඩ කරන දින විස්සක්" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තිය සංශෝධනය කිරීම

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තිය, පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:-

"(1අ) තත්කාර්ය සඳහා සමාගමට බලය පැවරීම සමාගමක ව්‍යවස්ථාවලියේ අරමුණ වන්නේ ද යන්න නොසලකා, සමාගමක් විසින් හාරක සඳහා වූ කොටස් බලපත්‍රයක් හෝ හාරක කොටස් බලපත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතු ය.

මෙම උපවගන්තියේ කාර්ය සඳහා-

"හාරක සඳහා වූ කොටස් බලපත්‍රයක්" යන්නෙන්, නිකුත් කරන ලද භෞතික බලපත්‍ර සහතිකයක් සහ අනුරේඛනය නොකළ ඒ හා සමාන යම් බලපත්‍රයක් හෝ සාධන පත්‍රයක් වන්නා වූ, සන්තකයේ පැවතීම මගින් දරන්නාගේ හිමිකාරිත්වය නිර්ණය වන්නා වූ ගනුදෙනු කළ හැකි සාධන පත්‍රයක් අදහස් වන අතර එයට -

(අ) නිශ්චිතව දක්වන ලද කොන්දේසි යටතේ සමාගමක කොටස් සඳහා සහභාගී වීමේ අයිතිවාසිකම් පමණක් පැවරෙන, එහෙත්, සාධන පත්‍රය ක්‍රියාත්මක හෝ නිදහස් නොකරන්නේ නම් හෝ නොකරන තෙක් කොටස්වල අයිතිය හෝ කොටස්වල අයිතියට හිමිකම නොපැවරෙන යම් සාධන පත්‍රයක්; සහ

(ආ) අයිතිකරු හඳුනා ගත හැකි වන විද්‍යුත් හෝ ලියාපදිංචි ආකෘතියක වූ බලපත්‍රයක් හෝ වෙනත් යම් සාධන පත්‍රයක්,

ඇතුළත් නොවේ; සහ

"හාරක කොටස්" යන්නෙන්, 49 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති අයිතිවාසිකම් ඇතුළත් වන මුත් නිකුත් කරන ලද භෞතික කොටස්

සහතිකය සහ 110(1)(අ)(iii) වගන්තියේ නම් කළ භාරක සඳහා වූ සුරැකුම් පතක් වැනි අනුරේඛනය නොකළ ඒ හා සමාන වෙනත් සාධන පත්‍රයක් සන්තකයේ පැවතීම මගින් පමණක් දරන්නාගේ හිමිකාරිත්වය නිර්ණය වන්නා වූ ගනුදෙනු කළ හැකි සාධන පත්‍රයක් අදහස් වන අතර, එයට, අයිතිකරු හඳුනාගත හැකි වන විද්‍යුත් හෝ ලියාපදිංචි ආකාරයෙන් වූ කොටස් සහතිකයක් අයත් නොවේ.”.

**5**. ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ 51අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:- ප්‍රධාන ප්‍රඥප්තියට අලුත් 51අ වගන්තිය ඇතුළත් කිරීම

“භාරක සඳහා වූ කොටස් බලපත්‍රයක් හෝ භාරක කොටස් බලපත්‍රයක් දරන්නන්ගේ කාර්ය.

**51අ.** (1) සෑම භාරක සඳහා වූ කොටස් බලපත්‍රයක් හෝ භාරක කොටස් බලපත්‍රයක් දරන්නකු ම එකී බලපත්‍රය හෝ කොටස නිකුත් කරන ලද සමාගම වෙත 2025 අංක දරන සමාගම් (සංශෝධන) පනත ක්‍රියාත්මක වීමේ දින සිට දින හැටක කාලයක දී, එකී නිකුත් කිරීම පිළිබඳව දැනුම්දිය යුතු වන අතර ඔහුගේ නම, ලිපිනය සහ සම්බන්ධ කරගත හැකි අනෙකුත් තොරතුරු ලිඛිතව සමාගම් ලේකම් වෙත ලබා දිය යුතු වේ.

(2) සමාගම විසින්, (1) වන උපවගන්තියේ සඳහන් තොරතුරු ලැබීමෙන් පසු ලේඛනයක් පවත්වා ගනිමින් එකී තොරතුරු වාර්තාගත කළ යුතු ය.

(3) යම් භාරක සඳහා වූ කොටස් බලපත්‍රයක් හෝ භාරක කොටස් බලපත්‍රයක් දරන්නකු, (1) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින අවස්ථාවක දී එකී භාරක සඳහා වූ කොටස් බලපත්‍රය හෝ භාරක කොටස් බලපත්‍රයට අනුබද්ධිත යම් අයිතිවාසිකමක් එම වගන්තියේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව අවසානයේ දී අහෝසි වූ ලෙසට සැලකිය යුතු ය.

(4) සෑම භාරක සඳහා වූ කොටස් බලපත්‍රයක් දරන්නකු විසින් ම හෝ භාරක කොටස් බලපත්‍රයක්

දරන්නකු විසින් ම 2025 අංක       දරන සමාගම් (සංශෝධන) පනත ක්‍රියාත්මක වීමේ දින සිට දින හැටක කාලයක් තුළ දී හෝ (3) වන උපවගන්තිය යටතේ අහෝසි වීමක දී, එකී භාරක සඳහා වූ කොටස් බලපත්‍රය හෝ භාරක කොටස් බලපත්‍රය, 123(1) වන වගන්තියේ විධිවිධාන යටතේ කොටස් ලේඛනයේ කාර්ය සඳහා, ලියාපදිංචි කළ හැකි ආකාරයේ කොටස් බවට පරිවර්තනය කළ යුතු වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තිය සංශෝධනය කිරීම

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තිය, එහි (3) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට, පහත කොටස ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(3) ප්‍රතිෂ්ඨාව ලැබීමෙන් පසුව, සමාගම විසින් එකී ප්‍රතිෂ්ඨාව ලද දින සිට වැඩ කරන දින විස්සක් ඇතුළත දී කොටස් විභජනය කිරීම සිදු කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, මේ උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව, එක් එක් කොටස් හිමියා විසින් දරනු ලබන කොටස් සංඛ්‍යාවට සමානුපාතිකව එකම පන්තියක වූ සියලු කොටස් හිමියන්ට, සමාගම් සංචිතවලින් සම්පූර්ණයෙන් ගෙවා නිමි කොටස් නිකුත් කිරීමේ දී අදාළ නොවිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියට අලුත් කාණ්ඩයක් ඇතුළත් කිරීම

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 130 වන වගන්තිය (කොටස් ලේඛනය) ට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් කාණ්ඩය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය, එම ප්‍රඥප්තියේ අලුත් කාණ්ඩයක් ලෙස බලාත්මක විය යුතු ය:-

**"අර්ථලාභී අයිතිය**

සමාගමක අර්ථලාභී අයිතිය පිළිබඳ විස්තර රෙජිස්ට්‍රාර්වරයාට ලබා දිය යුතු බව.

**130අ.**(1) මේ පනත යටතේ හෝ සමාගම්වලට අදාළ කලින් වූ යම් ලිඛිත නීතියක් යටතේ සංස්ථාපිත හෝ ලියාපදිංචි කළ (මේ ශීර්ෂය යටතේ "සමාගම" ලෙස හඳුන්වනු ලබන) සෑම සමාගමක් ම සංස්ථාපනය කරනු ලැබීමේ දී හෝ යම් කොටස් නිකුත් කිරීමෙන් හෝ කොටස් පැවරීමෙන් වැඩ කරන දින විස්සක් ඇතුළත දී නියමිත ආකෘතියෙන් රෙජිස්ට්‍රාර්වරයා වෙත -

(අ) සමාගමේ අර්ථලාභී අයිතිකරුවන්ගේ හඳුනාගැනීමේ ලේඛනයේ දක්වා ඇති පරිදි සම්පූර්ණ නම් සහ, ඉන් පෙර සම්පූර්ණ නම් ඇත්නම්;

(ආ) සමාගමේ අර්ථලාභී අයිතිකරුවන්ගේ උපන් දින සහ උපන් ස්ථාන, ජාතිකත්ව, පදිංචි රට සහ අවසන් වරට දන්නා ලිපින;

(ඇ) සමාගමේ අර්ථලාභී අයිතිකරුවන්ගේ පදිංචි ලිපින, ව්‍යාපාර ලිපින, විද්‍යුත් තැපැල් ලිපින සහ තැපැල් ලිපින;

(ඈ) සමාගමේ අර්ථලාභී අයිතිකරුවන්ගේ ජාතික හැඳුනුම්පත් අංක, බදු හැඳින්වීමේ අංක හෝ ගමන් බලපත්‍ර අංක සහ නිකුත් කළ රටවල්;

(ඉ) සමාගමේ අර්ථලාභී අයිතිකරුවන් සම්බන්ධ කර ගැනීමේ තොරතුරු; සහ

(ඊ) අර්ථලාභී අයිතියෙහි ස්වභාවය සහ ප්‍රමාණය සම්පූර්ණ ප්‍රකාශයකින් විස්තර කරමින්,

දැන්විය යුතු ය.

(2) සෑම කොටස් හිමිකරුවකු විසින් ම යම් කොටස් මිල දී ගැනීමක් හෝ කොටස් පැවරීමක් සිදු කර වැඩ කරන දින දහයක් ඇතුළත (1) වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති විස්තර සමාගම වෙත ලබා දිය යුතු ය.

(3) සමාගමක සෑම අධ්‍යක්ෂවරයකුම හා ලේකම්වරයකුම සමාගමේ අර්ථලාභී අයිතිය සම්බන්ධයෙන් (1) වන උපවගන්තියේ සඳහන් කර ඇති විස්තර පිළිබඳව දැනුවත් වූ විට, එම තොරතුරු රෙජිස්ට්‍රාර්වරයා වෙත හෙළිදරවු කළ යුතු ය.

(4) (අ) සමාගම විසින් ලේඛනයක් පවත්වා ගනිමින්, (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති තොරතුරු පිළිබඳව සමාගම දැනුවත් වූ විට,

එකී තොරතුරු එහි වාර්තාගත කළ යුතු අතර, සමාගම විසින්, 116 වන වගන්තියේ (3) වන උපවගන්තියේ (ආ) ඡේදයේ විධිවිධානවලට යටත්ව සමාගමේ අර්ථලාභී අයිතිකරුවන් පිළිබඳ එකී ලේඛනය එහි ලියාපදිංචි කාර්යාලයේ තැබිය යුතු ය.

(ආ) සමාගමේ කොටස් ලේඛනයේ ස්ථානය සම්බන්ධයෙන් 124 වන වගන්තියේ සඳහන් විධිවිධාන, අවශ්‍ය වෙනස්කම් සහිතව, සමාගමේ අර්ථලාභී අයිතිකරුවන් පිළිබඳ ලේඛනය සම්බන්ධයෙන් ද අදාළ විය යුතු ය.

(5) (අ) සමාගම විසින් එහි අර්ථලාභී අයිතිකරුවන් පිළිබඳ සහ එහි අර්ථලාභී අයිතියේ ස්වභාවය හා ප්‍රමාණය පිළිබඳ තොරතුරු වාර්තාගත කිරීම හා එම තොරතුරු එසේ වාර්තාගත කළ දින සිට අවම වශයෙන් අවුරුදු දහයක කාලසීමාවක් දක්වා පවත්වාගෙන යාම කළ යුතු ය.

(ආ) විසුරුවා හරිනු ලබන සමාගමක අද්මිනිස්ත්‍රාසිකරු හෝ ඈවරකරුවකු සහ සමාගම විසුරුවා හැරීමට සම්බන්ධව සිටින වෙනත් යම් තැනැත්තකු විසින් සමාගම විසුරුවා හරින ලද දින සිට හෝ සමාගම පැවතීම අන්‍යාකාරයෙන් නතර වූ දින සිට අවම වශයෙන් අවුරුදු පහක කාලයක්, සමාගමේ අර්ථලාභී අයිතිකරුවන්ගේ විස්තරවල සහ අර්ථලාභී අයිතියේ ස්වභාවය සහ ප්‍රමාණය පිළිබඳ විස්තරවල වාර්තා තබාගැනීම සහ පවත්වා ගැනීම කළ යුතු ය.

(6) රෙජිස්ට්‍රාර්වරයා විසින් (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති විස්තර වාර්තාගත කිරීම සඳහා ලේඛනයක් පවත්වාගත යුතු ය.

(7) තැනැත්තකු විසින් සමාගමක අර්ථලාභී අයිතිය දැරීම, අත්කරගැනීම හෝ එයට පසුකාලීනව වෙනසක් සිදු කිරීම පිළිබඳ විස්තර ලබා දීමෙන් වැඩ කරන දින දහ හතරක් ඇතුළත සමාගමක් විසින්, (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති එම විස්තර රෙජිස්ට්‍රාර්වරයා වෙත දැන්විය යුතු ය.

(8) සෑම සමාගමක් ම, (7) වන උපවගන්තියට යටත් ව, නියම කරනු ලබන ආකෘතියකින් සමාගමේ අර්ථලාභී අයිතිය පිළිබඳ විස්තර 131 වන වගන්තිය යටතේ වන වාර්ෂික වාර්තාව ද සමඟ භාර දිය යුතු ය.

(9) කොටස් හෝ ණය පත්‍ර සම්බන්ධයෙන් සම්බන්ධතාවක් දක්වන තැනැත්තන් ලෙස තොරතුරු ඉල්ලා සිටීමට ඇති බලයට අදාළව 181 වන වගන්තියේ වන විධිවිධාන, අදාළ වෙනස්කම් සහිතව, සමාගමක අර්ථලාභී අයිතිකරුවන්ට ද අදාළ විය යුතු ය.

(10) 262 වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කර මේ පනත යටතේ ලියාපදිංචි කරන ලද අක්වෙරළ සමාගමකට සහ මේ පනත යටතේ ලියාපදිංචි කළ විදේශීය සමාගමකට, 130අ සිට 130ඊ දක්වා වන වගන්තිවල විධිවිධාන අදාළ විය යුතු ය.

(11) මේ වගන්තියේ "සමාගම්වලට අදාළ කලින් වූ ලිඛිත නීතියක්" යන්නෙන්, (145 වන අධිකාරය වූ) සමාගම් ආඥාපනතින් හෝ 1982 අංක 17 දරන සමාගම් පනතින් හෝ මේ පනතින් ඉවත් කරන ලද යම් ලිඛිත නීතියක් අදහස් වේ.

සැපයිය යුතු විස්තර.

**130ආ.** සමාගමක් හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින්, නීතිපතිවරයා, 2006 අංක 6 දරන මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනත යටතේ පිහිටුවන ලද මූල්‍ය බුද්ධි ඒකකය, රේගු අධ්‍යක්ෂ-ජනරාල්වරයා, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා, මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම හෝ වෙනත් යම් සාපරාධී වරදක් සම්බන්ධයෙන් විමර්ශනය කිරීමේ වගකීම සහිත යම් රාජ්‍ය බලධාරියකු, යම් රාජ්‍ය ප්‍රසම්පාදන බලධාරියකු හෝ යම් නියාමන බලධාරියකු කරනු

ලබන ඉල්ලීමක් මත, 130අ වන වගන්තිය යටතේ සමාගමේ අර්ථලාභී අයිතිකරුවන් පිළිබඳ පවත්වා ගන්නා හෝ ඉදිරිපත් කරන ලද විස්තර ලබා දිය යුතු ය.

විස්තර ආරක්ෂිතව තබාගැනීම සහ විස්තර ලබා දීම සඳහා තැනැත්තකු පත් කිරීම.

**130ඇ.** (1) සමාගම විසින් ශ්‍රී ලංකාවේ පදිංචි-

(අ) සමාගමේ අර්ථලාභී අයිතිකරුවන්ගේ ලේඛනය ආරක්ෂිතව තබාගැනීම සඳහා වගවිය යුතු; සහ

(ආ) 130අ වන වගන්තිය ප්‍රකාරව වාර්තාගත කරන ලද සමාගමේ අර්ථලාභී අයිතිකරුවන් පිළිබඳ විස්තර 130ආ වන වගන්තියේ දක්වා ඇති තැනැත්තකුට හෝ අධිකාරියකට ලබා දීම සඳහා සමාගම විසින් බලය පවරන ලද,

තැනැත්තකු වන්නා වූ ස්වභාවික තැනැත්තකු පත් කළ යුතු ය.

(2) සමාගම විසින්, එකී බලය පවරන ලද තැනැත්තා පිළිබඳ විස්තර සමාගම සංස්ථාගත කරන අවස්ථාවේ දී ද එකී බලය පවරන ලද තැනැත්තා සම්බන්ධයෙන් ඊට පසුව කරනු ලබන වෙනස් කිරීමක් පිළිබඳ විස්තර නියම කරනු ලැබිය හැකි ආකෘතියකින් ද හෙළිදරව් කළ යුතු ය.

මහජනතාව සඳහා තොරතුරු.

**130ඈ.** සමාගමක අර්ථලාභී අයිතිකරුවන් පිළිබඳ තොරතුරු, මහජනයා විසින් කරන ලබන ඉල්ලීමක දී, රෙජිස්ට්‍රාර්වරයා විසින් විද්‍යුත් ආකාරයෙන් හෝ භෞතිකව පරීක්ෂා කිරීමට ලබා දිය යුතු නමුත් ලබා දෙන තොරතුරු සමාගමේ අර්ථලාභී අයිතිකරුවන්ගේ සම්පූර්ණ නම සහ සමාගමේ අර්ථලාභී අයිතියේ ස්වභාවය සහ ප්‍රමාණයට පමණක් සීමා විය යුතු ය:

කෙසේ වුව ද, 130අ වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) සිට (ඊ) දක්වා වූ ඡේදවල දක්වා ඇති යම් වැඩිමනත් තොරතුරක් විමසා සිටින මහජනයා අතරින් යම් අයකුට 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ පනතේ විධිවිධාන ප්‍රකාරව තොරතුරු ලබා ගැනීමට ඉල්ලීමක් කළ හැකි ය.

සමාගමේ අර්ථලාභී අයිතිකරුවන් පිළිබඳ ලේඛනයක් තබා ගැනීම හා පවත්වා ගෙන යාම පැහැර හැරීම.

**130ඉ.** සමාගමක්-

(අ) 130අ වන වගන්තියේ සඳහන් කර ඇති සමාගමේ අර්ථලාභී අයිතිකරුවන් පිළිබඳ ලේඛනය තබා පවත්වාගෙන යාම පැහැර හැර ඇති බවට හෝ පැහැර හරින බවට;

(ආ) 130අ වන වගන්තියේ සඳහන් කර ඇති යම් කාලසීමාවකට අනුකූල වීම පැහැර හැර ඇති බවට හෝ පැහැර හරින බවට,

විශ්වාස කිරීමට රෙජිස්ට්‍රාර්වරයාට සාධාරණ හේතු ඇත්නම්, රෙජිස්ට්‍රාර්වරයා විසින්, එය ලැබීමෙන් වැඩ කරන දින හතක කාල සීමාවක් තුළ දී 130අ වන වගන්තියේ විධිවිධානවලට අනුකූල වන ලෙස සමාගමට විධානය කරමින් සමාගම වෙත ලිඛිතව විධානයක් නිකුත් කළ යුතු ය.

අර්ථලාභී අයිතිය සඳහා කරනු ලබන හිමිකම් පෑම.

**130ඊ.** වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, සමාගමක අර්ථලාභී අයිතිය පිළිබඳ හිමිකම්පෑමක්, එකී අර්ථලාභී අයිතිය මෙම ශීර්ෂය යටතේ දක්වා ඇති ආකාරයට හෙළිදරවු කර සහ ලියාපදිංචි කර නොමැති නම්, ලබා ගැනීම හෝ පිළිගැනීම කළ නොහැකි ය.

වැරදි.

**130උ.** (1) (අ) 130අ වන වගන්තියේ (1), (3), (4), (7) හෝ (8) වන උපවගන්ති උල්ලංඝනය කරන හෝ එම උපවගන්තිවලට අනුකූල වීම පැහැර හරින;

(ආ) සමාගමක අර්ථලාභී අයිතිකරුවකු පිළිබඳ හෝ සමාගමේ අර්ථලාභී අයිතියේ ස්වභාවය හා ප්‍රමාණය පිළිබඳව අසත්‍ය හෝ නොමග යවන සුලු විස්තර දැන දැනම ලබා දෙන;

(ඇ) 130අ වන වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් කර ඇති පරිදි ලේඛනයට ඇතුළත් කළ යුතු සමාගමේ අර්ථලාභී අයිතිකරුවකු පිළිබඳ විස්තර ඇතුළත් කිරීම දැන දැනම අත්හිටුවන; හෝ

(ඈ) 130අ වන වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් කර ඇති ලේඛනයට දැන දැනම වැරදි විස්තර ඇතුළත් කරන,

සමාගමක් වරදක් සිදු කරන අතර, වරදකරු කරනු ලැබීමේ දී රුපියල් ලක්ෂ දහයක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු දහයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට යටත් විය යුතු ය.

(2) මේ වගන්තිය යටතේ වරදක් සිදු කරනු ලබන අවස්ථාවක දී එකී වරද සිදු කරනු ලබන විට එම සමාගමේ අධ්‍යක්ෂවරයකු හෝ නිලධරයකු වන සෑම තැනැත්තකු ම, එකී වරද සිදු කරනු ලැබුවේ එම තැනැත්තාගේ දැනුමින් තොරව වන බවට හෝ එකී වරද සිදු කිරීම වැළැක්වීමට එකී තැනැත්තා සියලු උද්යෝගයෙන් ක්‍රියා කළ බවට ඔප්පු කරනු ලැබුවහොත් මිස, ඒ වරද සිදු කර ඇත්තා සේ සැලකිය යුතු ය.

(3) 130අ වන වගන්තියේ (2) වන උපවගන්තියේ හෝ 130අ හෝ 130ඇ වන වගන්තිවල (3) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන හෝ

ඒවාට අනුකූලවීම පැහැර හරින කොටස්කරුවකු, ලේකම්වරයකු හෝ බලයලත් තැනැත්තකු වරදක් සිදු කරන අතර වරදකරු කරනු ලැබීමේ දී රුපියල් ලක්ෂ දහයක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු දහයක් නොඉක්මවන දෙයාකාරයෙන් එක් ආකාරයක සිර දඬුවමකට හෝ එම දඩය හා සිරදඬුවම යන දෙකටම යටත් විය යුතු ය.

සමාගමේ අර්ථලාභී අයිතිය හා සම්බන්ධ විස්තර වාර්තා කිරීම, ලැබීම ආදියට අදාළ විශේෂ විධිවිධාන.

**130ඉ.** (1) 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ හෝ සමාගම්වලට අදාළ කලින් වූ යම් ලිඛිත නීතියක් යටතේ සංස්ථාපිත හෝ ලියාපදිංචි කරන ලද සහ 2025 අංක දරන සමාගම් (සංශෝධන) පනත ක්‍රියාත්මක වන දිනයේ දී අර්ථලාභී අයිතිකරුවන් සිටින සෑම සමාගමක්ම, 2025 අංක දරන සමාගම් (සංශෝධන) පනත ක්‍රියාත්මක වන දින සිට මාස හයක් ඇතුළත, 130අ වගන්තියේ විධිවිධාන ප්‍රකාරව එම සමාගමේ අර්ථලාභී අයිතිකරුවන් පිළිබඳ විස්තර නියමිත ආකෘතියෙන් සහ ආකාරයෙන්, සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත යොමු කරනු ලැබිය යුතු ය.

(2) බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක සෑම තැන්පතුධාරිකයක් විසින් ම, 2025 අංක දරන සමාගම් (සංශෝධන) පනත ක්‍රියාත්මක වන දින සිට දින තිහක් ඇතුළත, සමාගමක නිකුත් කළ කොටස් වලින් සියයට දහයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් 2025 අංක දරන සමාගම් (සංශෝධන) පනත ක්‍රියාත්මක වන දිනට දරනු ලබන සමාගමේ කොටස්කරුවන්ගේ තොරතුරු නියමිත ආකෘතියෙන් සහ ආකාරයෙන්, තහවුරු කිරීම, වාර්තා කිරීම, වාර්තාගත කිරීම සහ රෙජිස්ට්‍රාර්වරයා වෙත දැනුම් දීම කරනු ලැබිය යුතු ය.

(3) සෑම සමාගමක් විසින් ම, 2025 අංක දරන සමාගම් (සංශෝධන) පනත ක්‍රියාත්මක වන දිනයේ දී වූ සමාගමේ අර්ථලාභී අයිතිකරුවන් පිළිබඳ තොරතුරු, නියමිත ආකෘතියෙන් සහ ආකාරයෙන්, 2025 අංක දරන සමාගම්

(සංශෝධන) පනත ක්‍රියාත්මක වන දින සිට දින තිහක් ඇතුළත වාර්තා කිරීම, වාර්තාගත කිරීම සහ රෙජිස්ට්‍රාර්වරයා වෙත දැනුම් දීම කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ යම් විධිවිධානයක් උල්ලංඝනය කරන හෝ ඊට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින සමාගමක් වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පනස්දහසක් නො ඉක්මවන දඩයකට හෝ මාස හයක් නො ඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

(5) මෙම වගන්තියේ "සමාගම්වලට අදාළ කලින් වූ යම් ලිඛිත නීතියක්" යන්නෙන් (145 වන අධිකාරය වූ) සමාගම් ආඥාපනතෙන් හෝ 1982 අංක 17 දරන සමාගම් පනතින් හෝ මේ පනතින් ඉවත් කරන ලද යම් ලිඛිත නීතියක් අදහස් වේ.

නියෝග.

**130එ.** අමාත්‍යවරයා විසින් පහත සඳහන් සියලු කාරණා හෝ යම් කාරණාවක් සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය:-

(අ) සමාගමේ අර්ථලාභී අයිතිය පිළිබඳ ලේඛනය පවත්වා ගෙන යාම;

(ආ) සමාගමේ අර්ථලාභී අයිතිය අත් කරගැනීම පිළිබඳව වාර්තා කිරීම; සහ

(ඇ) සමාගමේ අර්ථලාභී අයිතිය පිළිබඳ විස්තර ලබා ගැනීම.

අර්ථ නිරූපණය.

**130ඒ.** මේ ශීර්ෂය යටතේ -

"අර්ථලාභී අයිතිය" යන්නෙන්, කොටස්වල හෝ ඡන්දය සඳහා අයිතිවාසිකම් හෝ සමාගමක අයිතිය පිළිබඳ සම්බන්ධතාවල ඍජු හෝ වක්‍ර අයිතිය හෝ පාලනය කිරීම හරහා සම්පූර්ණ සමාගමක හෝ එහි කොටසක සියයට දහයකට වැඩි ප්‍රතිශතයක පරම අයිතිය හෝ පාලනය සතු වන ස්වභාවික තැනැත්තකු අදහස් වන අතර, එයට, අනෙකුත් ක්‍රම මගින් සඵල පාලනයක් ක්‍රියාත්මක කරන ස්වභාවික තැනැත්තකු ද අයත් වන අතර, ඒ අනුව අර්ථලාභී අයිතිය තේරුම් ගත යුතු ය;

"සඵල පාලනය" යන්නට, ජාල අයිතියක් මගින් අධ්‍යක්ෂවරුන් පත්කිරීම හෝ ඉවත් කිරීම මගින් හෝ සමාගමේ මෙහෙයුම්වලට එහි ව්‍යාපාර පිළිවෙත්වලට හෝ සමාගමේ සාමාන්‍ය පාලනයට බලපාන්නා වූ ක්‍රමෝපාය තීරණ ගැනීමේ හැකියාව වැනි වක්‍ර මාර්යකින් අයිතිය පාලනය කරනු ලබන තත්ත්වයක් ද අයත් වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 206 වන වගන්තිය සංශෝධනය කිරීම

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 206 වන වගන්තිය, එහි (2) වන සහ (3) වන උපවගන්ති ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන අලුත් උපවගන්ති ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(2) සමාගමක් විසින් අධ්‍යක්ෂවරයකු ඉවත් කර, එසේ ඉවත් කරනු ලබන අධ්‍යක්ෂවරයා වෙනුවට අලුත් අධ්‍යක්ෂවරයකු පත් කිරීමට අදහස් කරනු ලබන අවස්ථාවක, සමාගමේ සියලු කොටස්හිමියන් වෙත විශේෂ දැන්වීමක් ලබා දිය යුතු අතර, ඉවත් කරනු ලබන අධ්‍යක්ෂවරයා වෙත එකී විශේෂ දැන්වීමේ පිටපතක් යැවීම එම සමාගමේ

ලේකම්වරයාගේ වගකීම විය යුතු ය. එම අධ්‍යක්ෂවරයා එම සමාගමේ කොටස් හිමියකු වේ ද නොවේ ද යන්න නොසලකා, එකී අධ්‍යක්ෂවරයාට එම රැස්වීමක දී කරුණු කියාපෑමට හිමිකම් තිබිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ වන විශේෂ දැන්වීම ලැබීමෙන් පසු, අදාළ අධ්‍යක්ෂවරයා විසින්, එම විශේෂ දැන්වීම ලැබුණු දින සිට වැඩකරන දින දාහතරක් ඇතුළත, සමාගමේ එක් එක් කොටස්හිමියා වෙත ඒ කරුණු දැනුම් දෙන ලෙස සමාගමෙන් ඉල්ලා සිටිමින් සමාගම වෙත ලිඛිතව කරුණු දැක්වීමක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(4) සමාගමේ ලේකම්වරයා විසින් වහාම එම කරුණු දැක්වීමේ පිටපතක් සමාගමේ සෑම කොටස්හිමියකු වෙතම යවනු ලැබිය යුතු ය. සමාගමේ නොසැලකිල්ල හේතුවෙන් හෝ එම නිශ්චිතව දක්වා ඇති කාලසීමාව අවසන් වීමෙන් පසුව ලැබීම හේතුවෙන් එම කරුණු දැක්වීම යවා නොමැති අවස්ථාවක, එකී අධ්‍යක්ෂවරයා විසින් එසේ ඉල්ලා සිටිනු ලබන්නේ නම්, සමාගමේ ලේකම්වරයා විසින්, එම කරුණු දැක්වීම රැස්වීමේ දී කියවනු ලැබිය යුතු ය:

එසේ වුව ද, අපහාසාත්මක ස්වභාවයෙන් අනවශ්‍ය ප්‍රසිද්ධියක් ලබා ගැනීම සඳහා අදාළ අධ්‍යක්ෂවරයා විසින් මේ වගන්තියේ විධිවිධාන අනිසි ලෙස යොදාගනු ලබන බවට අධිකරණය සෑහීමට පත් කිරීමට සමාගමට හැකි වන අවස්ථාවක, අදාළ අධ්‍යක්ෂවරයා විසින් නඩු ගාස්තු ගෙවිය යුතු බවට වූ ආඥාවක් මත අධිකරණයෙන් ලබාගත් අවසරය ඇතිව, සමාගම විසින්, එම කරුණු දැක්වීම කොටස් හිමියන් වෙත යැවීමෙන් හෝ එම කරුණු දැක්වීම රැස්වීමේ දී කියවීමෙන් වැළකී සිටිනු ලැබිය හැකි ය.”.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 211 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ “ඔහුගේ පත්වීමේ දින සිට එක් අවුරුද්දක් සඳහා පමණක් වලංගු විය හැකි ය.” යන වචන වෙනුවට “පනතේ 133 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයට යටත්ව ඊළඟ වාර්ෂික මහා සභා රැස්වීම තෙක් වලංගු වන්නේ ය.” යන වචන ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 211 වන වගන්තිය සංශෝධනය කිරීම

ප්‍රධාන ප්‍රඥප්තියේ 270 වන වගන්තිය සංශෝධනය කිරීම

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 270 වන වගන්තිය, එහි (ඇ) ඡේදය ඉවත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 272 වන වගන්තිය සංශෝධනය කිරීම

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 272 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ (අ) වන ඡේදයේ (i) වන අනු ඡේදය ඉවත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 341 වන වගන්තිය සංශෝධනය කිරීම

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 341 වන වගන්තිය, එහි (3) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(3) (1) වන උපවගන්තියේ සඳහන් රැස්වීම් පවත්වන ලද දින සිට හෝ එම දිනයේ දී එකී රැස්වීම් පවත්වනු නොලැබුවේ නම්, පසුව පවත්වන ලද රැස්වීමේ දින සිට සතියක් ඇතුළත ඇවරකරු විසින් ගිණුම් විස්තරයේ පිටපතක් රෙජිස්ට්‍රාර්වරයා වෙත යවනු ලැබිය යුතු අතර, රැස්වීම් පවත්වනු ලැබූ බව තහවුරු කරමින් ඔහු වෙත වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. තව ද මේ උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව පිටපත යවනු නොලැබූ හෝ වාර්තාව ඉදිරිපත් කරනු නොලැබූ අවස්ථාවක, ඇවරකරු වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 424 වන වගන්තිය සංශෝධනය කිරීම

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 424 වන වගන්තිය, එහි (2) වන උපවගන්තියේ "නියම කරනු ලැබිය හැකි ය." යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"නියම කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, යම් අද්මිනිස්ත්‍රාසිකරුවකුට මේ උපවගන්තිය යටතේ ලබා දෙන දැන්වීමේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව ඇතුළත නියම කරන ලද තොරතුරු සැපයීමට නොහැකි අවස්ථාවක, එකී අද්මිනිස්ත්‍රාසිකරු විසින්, එකී නොහැකියාවට හේතු දක්වමින් රෙජිස්ට්‍රාර්වරයා

වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය. එකී ඉල්ලීම සහ හේතු සලකා බැලීමෙන් පසු, රෙජිස්ට්‍රාර්වරයා විසින්, නියම සහ කොන්දේසි කිසිවක් වෙතොත් එම නියම සහ කොන්දේසිවලට යටත්ව, තොරතුරු සැපයීම සඳහා නිශ්චිතව දක්වා ඇති කාලසීමාව දීර්ඝ කරනු ලැබිය හැකි ය. රෙජිස්ට්‍රාර්වරයා විසින්, ඔහුගේ තීරණය අද්මිනිස්ත්‍රාසිකරු සහ ණය හිමියන්ගේ කමිටුව වෙත ලිඛිතව සන්නිවේදනය කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 471 වන වගන්තිය සංශෝධනය කිරීම

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 471 වන වගන්තිය පහත පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (1) වන උපවගන්තියේ (අ) ඡේදයට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(අඅ) සමාගම් අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වශයෙන් හෝ සමාගම් අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා ලෙස ක්‍රියා කිරීමට හෝ නාමයෙන් හෝ ධුරයෙන් තැනැත්තකු;";

(2) එහි (2) වන උපවගන්තියේ "(1) වන උපවගන්තිය යටතේ නියෝජ්‍ය සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයකු" යන වචන සහ අංක වෙනුවට, "(1) වන උපවගන්තිය යටතේ අතිරේක සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයකු හෝ නියෝජ්‍ය සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයකු" යන වචන හා අංක ආදේශ කිරීමෙන්; සහ

(3) එහි (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:-

"(3) සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ යම් නිලධරයන් පන්තියකට හෝ කාණ්ඩයකට, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා, යම් ආකාරයෙන් හා යම් ප්‍රමාණයකින් දිරි දීමනා ගෙවිය හැකි අතර එය නියම කරනු ලබන සේවා කොන්දේසිවලට යටත් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 472 වන වගන්තිය සංශෝධනය කිරීම

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 472 වන වගන්තිය, එහි (1) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(1) රෙජිස්ට්‍රාර්වරයාගේ ක්‍රියාවකින් හෝ තීරණයකින් අතෘප්තියට පත් තැනැත්තකු විසින්, එකී ක්‍රියාව හෝ තීරණය පිළිබඳ දැන්වීම ලැබීමෙන් වැඩකරන දින පහළොවක් හෝ අධිකරණය විසින් ඉඩ දෙනු ලබන වැඩිදුර කාලයක් ඇතුළත අධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියට 484අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 484 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 484අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:-

"ක්‍රියා සඳහා කාලය දීර්ඝ කිරීමක් ප්‍රදානය කිරීමට රෙජිස්ට්‍රාර්වරයා සතු බලය.

**484අ.** (1) සමාගමකට 484 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වන දැන්වීමේ නිශ්චිතව දක්වා ඇති දිනයට පෙර තොරතුරු සැපයීමට හෝ යම් පොතක්, ලේඛනයක් හෝ වෙනත් ලේඛනයක් ඉදිරිපත් කිරීමට නොහැකි වන අවස්ථාවක, එකී සමාගම විසින්, ඒ සඳහා වූ හේතු ද සමග එකී කාලසීමාව දීර්ඝ කිරීම සඳහා රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය. එකී ඉල්ලීම සහ හේතු සලකා බැලීමෙන් පසු, රෙජිස්ට්‍රාර්වරයා විසින්, පනවනු ලැබීමට සුදුසු යැයි ඔහු විසින් සලකනු ලැබිය හැකි නියම සහ කොන්දේසිවලට යටත්ව එකී කාලසීමාව දීර්ඝ කරනු ලැබිය හැකි ය. රෙජිස්ට්‍රාර්වරයා විසින්, ඔහුගේ තීරණය සමාගම වෙත ලිඛිතව සන්නිවේදනය කරනු ලැබිය යුතු ය.

(2) සමාගම විසින් (1) වන උපවගන්තිය යටතේ වූ දීර්ඝ කරන ලද කාලසීමාව ඇතුළත විධානයට අනුකූලව කටයුතු කිරීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක-

(අ) සමාගම වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් ලක්ෂ පහක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය;

(ආ) පැහැර හැරීම කරන ලද සමාගමේ සෑම නිලධරයකුම වරදට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් ලක්ෂ දෙකක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 487 වන වගන්තිය සංශෝධනය කිරීම

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 487 වන වගන්තිය, එහි (5) වන උපවගන්තියේ “රජය වෙත සතු විය යුතු හා රජයට මනාපයක් කළ හැකි විය යුතු ය.” යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

“රජය සතු විය යුතු අතර, රජයට කැමැත්තක් කළ හැකි විය යුතු ය:

එසේ වුව ද, (3) වන උපවගන්තිය යටතේ නම කපා හරිනු ලැබ ඇත්තේ යම් සමාගමක ද, එම සමාගම විසින්, 2025 අංක  දරන සමාගම් (සංශෝධන) පනත ක්‍රියාත්මක වන දින සිට අවුරුදු දහයක කාලසීමාවක් ඉකුත් වීමට පෙර, නීතිපතිවරයා එකී ඉල්ලීමේ පාර්ශ්වකරුවකු කරමින් අධිකරණය වෙත ඉල්ලීමක් කර (1) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීමට එකී සමාගමට නොහැකි වූයේ මන්ද යන්න පිළිබඳ හේතු සඳහන් කරමින් අධිකරණය සෑහීමට පත්වන පරිදි හේතු දක්වනු ලැබිය හැකි ය. අධිකරණය, එය විසින්, අවශ්‍ය යැයි සලකනු ලැබිය හැකි පරීක්ෂණයකින් පසු, සමාගම ලියාපදිංචි කිරීමට අවසර දිය හැකි වන අතර, එවැනි ලියාපදිංචියක් කිරීමෙන් පසු මේ උපවගන්තිය යටතේ කලින් රජය වෙත සතු වූ සියලු දේපළ සමාගමට ආපසු  භාර දීම සඳහා ආඥාවක් කරනු ලැබිය හැකි ය:

එසේ ම තවදුරටත්, මේ උපවගන්තියේ විධිවිධාන යටතේ රජය සතු වූ දේපළ රජය විසින් විකුණා ඇති හෝ බැහැර කර ඇති අවස්ථාවක, සද්භාවයෙන් යුතුව රජයෙන් එකී අයිතිවාසිකම් අත්කර ගෙන ඇති තුන්වන පාර්ශ්වයන්ගේ අයිතිවාසිකම්වලට එමගින් කිසිදු ආකාරයකින් බලපෑමක් නොවිය යුතු ය:

එසේ වුව ද, දේපළ විනාශ වී ඇති හෝ දේපළවලට අලාභහානි වී ඇති අවස්ථාවක හෝ දේපළවල භෞතික

සන්තකය රජය විසින් ලබා ගෙන නොමැති අවස්ථාවක, රජය කිසිම ආකාරයකින් කිසිම පාර්ශ්වයකට වගකියනු නොලැබිය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 508 වන වගන්තිය සංශෝධනය කිරීම

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 508 වන වගන්තිය, එහි (1) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

“(1) (අ) මේ පනතේ විධිවිධාන බලාත්මක කිරීමේ දී පැන නගින; හෝ

(ආ) යම් සමාගමක කටයුතු කළමනාකරණයට අදාළ,

ආරාවුලක පාර්ශ්වකරුවකු විසින්, එම ආරාවුල සමථයකට පත් කිරීම සඳහා සමාගම් ආරාවුල් මණ්ඩලයේ සාමාජිකයකු වෙත යොමු කරනු ලැබිය හැකි බවට සමාගම් ආරාවුල් මණ්ඩලය වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි අතර, සමාගම් ආරාවුල් මණ්ඩලයේ සභාපතිවරයා විසින්, ඔහු විසින් උචිත යැයි සලකනු ලබන්නේ නම්, එම ආරාවුල සමථයකට පත් කිරීම සඳහා සමාගම් ආරාවුල් මණ්ඩලයේ යම් සාමාජිකයකු වෙත යොමු කරනු ලැබිය හැකි ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියට 513අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 513 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 513අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:-

“සාමාන්‍ය දණ්ඩන.

**513අ.**(1) එකී වරද සඳහා ප්‍රකාශිතවම කිසිදු දඬුවමක් නියම කර නොමැති මේ පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක යම් විධිවිධානයක් උල්ලංඝනය කරන හෝ ඊට අනුකූලව කටයුතු කිරීම පැහැර හරින තැනැත්තකු, අධ්‍යක්ෂවරයකු, ලේකම්වරයකු හෝ නිලධරයකු වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් ලක්ෂ පහක් නො ඉක්මවන දඩයකට හෝ මාස හයක් නො ඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

(2) පුද්ගල මණ්ඩලයක් විසින් මේ පනතේ යම් විධිවිධානයක් උල්ලංඝනය කර හෝ නොකර හැර හෝ ඊට අනුකූලව කටයුතු කිරීම පැහැර හැර ඇතිවිට හා ඒ සඳහා මේ පනතින් කිසිදු දඬුවමක් ප්‍රකාශිතවම නියම කර නොමැති අවස්ථාවක, එම පුද්ගල මණ්ඩලය -

(අ) සංස්ථාපිත මණ්ඩලයක් නම්, එම සංස්ථාපිත මණ්ඩලයේ සෑම අධ්‍යක්ෂවරයකු ම, කළමනාකරුවකු ම හෝ ලේකම්වරයකු ම;

(ආ) ව්‍යාපාර ආයතනයක් නම්, එම ව්‍යාපාර ආයතනයේ සෑම හවුල්කරුවකු ම; හෝ

(ඇ) ව්‍යාපාර ආයතනයක් නොවන සංස්ථාපිත නොවන මණ්ඩලයක් නම්, එම මණ්ඩලයේ සෑම සාමාජිකයකු ම,

වරදක් සිදු කර ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් ලක්ෂ පහක් නො ඉක්මවන දඩයකට හෝ එක් අවුරුද්දක් නො ඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය:

එසේ වුව ද, එකී වරද ඔහුගේ දැනීමෙන් තොරව සිදු කර ඇති බව නැතහොත් එකී වරද සිදු කිරීම වැළැක්වීම සඳහා තමා නිසි උද්යෝගයෙන් ක්‍රියා කළ බව ඒ තැනැත්තා විසින් ඔප්පු කරනු ලබන්නේ නම්, ඔහු වරදකට වරදකරු ලෙස සලකනු නොලැබිය යුතු ය.''.

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ 529 වන වගන්තිය, එහි ''බෙදාහැරීම'' යන යෙදුමේ අර්ථ නිරූපණයේ (අ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 529 වන වගන්තිය සංශෝධනය කිරීම

''(අ) සමාගමේ කොටස් හැර කොටස් හිමියකුගේ ප්‍රතිලාභය උදෙසා හෝ ඒ වෙනුවෙන් සමාගමේ

සංචිත ප්‍රාග්ධනීකරණය මඟින් කෙලින්ම හෝ අන්‍යාකාරයකින් මුදල් හෝ දේපළ මාරු කිරීම; හෝ".

**21.** මෙහි උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති ප්‍රධාන ප්‍රඥප්තියේ වගන්ති, එම උපලේඛනයේ II වන තීරයේ අනුරූපී සටහනේ නිශ්චිතව දක්වා ඇති වචන වෙනුවට, එම උපලේඛනයේ III වන තීරයේ අනුරූපී සටහනේ නිශ්චිතව දක්වා ඇති වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ ඇතැම් වගන්ති සංශෝධනය කිරීම

**22.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**උපලේඛනය**

[21 වන වගන්තිය]

| අංකය | I වන තීරය සංශෝධිත වගන්ති | II වන තීරය ඉවත් කිරීම | III වන තීරය ඇතුළත් කිරීම |
|---|---|---|---|
| 1 | 19(2) | "(ආ)" ඡේදය | "(ආ)" ඡේදය |
| 2 | 28(1) | "නියමයන්ට තවදුරටත් අනුකූලව ක්‍රියා නොකරන" | "නියමයන්ට තවදුරටත් අනුකූලව ක්‍රියා නොකරන" |
| 3 | 37(3)(අ) | "කොටස් හෝ සෘණ පත්‍ර" | "කොටස් හෝ සෘණ පත්‍ර" |
| 4 | 40(3)(ආ) | "ලේඛන (කිසිවක් වේ නම්)" | "ලේඛන (කිසිවක් වේ නම්)" |
| 5 | 40(4) | "සංස්ථා ප්‍රකාශයක්" | "සංස්ථා ප්‍රකාශයක්" |
| 6 | 41 (පැතිසටහන) | "සංස්ථා ප්‍රකාශයෙහි ඇති අසත්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් සිවිල් වගකීම." | "සංස්ථා ප්‍රකාශයෙහි ඇති අසත්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් සිවිල් වගකීම." |
| 7 | 41(2)(ඇ) | "ප්‍රසිද්ධ දැන්වීමක්" | "ප්‍රසිද්ධ දැන්වීමක්" |
| 8 | 44(ආ) | "යොමු කිරීමෙන් එහි අන්තර්ගත කොට" | "යොමු කිරීමෙන් එහි අන්තර්ගත කොට" |

| | | | |
|---|---|---|---|
| 9 | 61(3)(ආ) | “මුදා හැරීම,” | “මුදා හැරීම,” |
| 10 | 64(3)(අ) | “අර්පණයක් ඉදිරිපත් කිරීමට” | “අර්පණයක් ඉදිරිපත් කිරීමට” |
| 11 | 67(2)(ආ) | “56 වන වගන්තියේ කාර්ය සඳහා” | “56 වන වගන්තියේ කාර්ය සඳහා” |
| 12 | 77(1) | “කොටස් හෝ සෘණ පත්‍ර පිළිබඳව බැලූ බැල්මට” | “කොටස් හෝ සෘණ පත්‍ර පිළිබඳව බැලූ බැල්මට” |
| 13 | 84(2) | “ඒ ප්‍රමුඛත්වය” | “ඒ ප්‍රමුඛත්වය” |
| 14 | 84(4) | “වෙනත් සෘණ පත්‍රයක් නිකුත් කිරීම,” | “වෙනත් සෘණ පත්‍රයක් නිකුත් කිරීම,” |
| 15 | 84(5) | “යම් තැනැත්තකුට ලැබිය හැකිව තිබූ යම් අයිතිවාසිකමකට හෝ ප්‍රමුඛත්වයකට,” | “යම් තැනැත්තකුට ලැබිය හැකිව තිබූ යම් අයිතිවාසිකමකට හෝ ප්‍රමුඛත්වයකට,” |
| 16 | 86(3) | “කොටස් පවරනු ලැබ ඇත්තේ” | “කොටස් පවරනු ලැබ ඇත්තේ” |
| 17 | 92(1)(ආ) | “කාර්ය සඳහා විශාල ගණුදෙනුවක්” | “කාර්ය සඳහා විශාල ගනුදෙනුවක්” |
| 18 | 92(1)(ඉ) | “(1) වන උපවගන්තියේ” | “(1) වන උපවගන්තියේ” |
| 19 | 95(2) | “(1) වන උපවගන්තිය යටතේ” | “(1) වන උපවගන්තිය යටතේ” |
| 20 | 98(2) | “සමාගම විසින්” | “සමාගම විසින්” |
| 21 | 102(4) | “මේ වගන්තියේ විධිවිධාන” | “මේ වගන්තියේ විධිවිධාන” |
| 22 | 102(11)(අ) | “රුපියල් පනස් දහසක්” | “රුපියල් පනස් දහසක්” |
| 23 | 111(4) | “ක්‍රියා කිරීම සමාගමක් විසින් පැහැර හරිනු ලැබුවහොත්-” | “ක්‍රියා කිරීම සමාගමක් විසින් පැහැර හරිනු ලැබුවහොත්-” |
| 24 | 116(2) | “(ඌ) සහ (ඔ) ඡේදවල සඳහන්” | “(ඌ) සහ (ඔ) ඡේදවල සඳහන්” |

| | | | |
|---|---|---|---|
| 25 | 119(1)(ආ) | "සියලු කොටස් හිමියන් වෙත" | "සියලු කොටස් හිමියන් වෙත" |
| 26 | 127 | "බෙදාහරින යම් ප්‍රවෘත්ති පත්‍රය" | "බෙදාහරින යම් පුවත්පතක" |
| 27 | 129(1) | "කොටස් ලේඛනයේ ඇතුළත් කරණු" | "කොටස් ලේඛනයේ ඇතුළත් කරුණු" |
| 28 | 142(5) | "කරනු ලැබූ ඉල්ලීමක් මත සමාගම දරන සම්පූර්ණ වියදම" | "කරනු ලැබූ ඉල්ලීමක් මත සමාගම දරන සම්පූර්ණ වියදම" |
| 29 | 152(1)(ඇ) | "වෙනුවෙන්" | "වෙනුවෙන්" |
| 30 | 167(1) | "වාර්ෂික වාර්තාවේ" | "වාර්ෂික වාර්තාවේ" |
| 31 | 168(1)(ඒ) | "පාලිත සමාගමක්" | "පාලිත සමාගමක්" |
| 32 | 168(2) | "(1) වන උපවගන්තියේ (ඇ) සිට (ඒ) තෙක් වූ ඡේදවල" | "(1) වන උපවගන්තියේ (ඇ) සිට (ඒ) තෙක් වූ ඡේදවල" |
| 33 | 175(5) | "ඇතද" | "ඇතද" |
| 34 | 180(4) | "පරීක්ෂකවරයකු පත් කරනු ලැබූ අවස්ථාවක" | "පරීක්ෂකවරයකු පත් කරනු ලැබූ අවස්ථාවක" |
| 35 | 182(3) | "අභියාචනාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු" | "අධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු" |
| 36 | 185(2) | "ද්‍රව්‍යමය වුව ද, අද්‍රව්‍යමය වුව ද" | "ද්‍රව්‍යමය වුව ද, අද්‍රව්‍යමය වුව ද" |
| 37 | 220(1) | "දින සිට" | "දින සිට" |
| 38 | 220(4) | "බලය දෙන හෝ ඒ පැහැර හැරීම දිගටම කරගෙන යාමට ඉඩ දෙන" | "බලය දෙන හෝ ඉඩ දෙන හෝ ඒ පැහැර හැරීම දිගටම කරගෙන යාමට ඉඩ දෙන" |
| 39 | 228(ඇ) | "(iii)" | "(iii)" |
| 40 | 241(3)(ඉ) | "හැකි කිරීමෙහිලා අවශ්‍ය වන" | "හැකි කිරීමෙහිලා අවශ්‍ය වන" |
| 41 | 242(1)(ආ)(iii) | "සෑහීමට පත්වන" | "සෑහීමට පත්වන" |

| | | | |
|---|---|---|---|
| 42 | 242(5) | "සහතිකයක් අත්සන් කළ යුතු ය." | "සහතිකයක් අත්සන් කරනු ලැබිය යුතු ය." |
| 43 | 245(ඊ) | "ඒකාබද්ධ කරනු ලබන සමාගමක් විසින් හෝ ඊට විරුද්ධව" | "ඒකාබද්ධ කරනු ලබන සමාගමක් විසින් හෝ ඊට විරුද්ධව" |
| 44 | 246(3) | "කොටස් අත්කර ගැනීමට යන" | "කොටස් අත්කර ගැනීමට යන" |
| 45 | 248(2) | "(1) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ" | "(1) වන උපවගන්තියේ (ඉ) ඡේදය යටතේ" |
| 46 | 249(2)(ආ)(vii) | "විස්තර ඇතුළත්" | "විස්තර ඇතුළත්" |
| 47 | 273(1) | "ගණන් බේරා වසා දැමීම සඳහා වූ පෙත්සමක් විභාග කරන විට" | "ගණන් බේරා වසා දැමීම සඳහා වූ පෙත්සමක් විභාග කරන විට" |
| 48 | 274(ආ) | "වැඩිදුර නඩු කටයුතු තහනම් කරන" | "වැඩිදුර නඩු කටයුතු තහනම් කරන" |
| 49 | 283(1) | "පිළිවෙළින් ඒ සුරකුම්පත් දෙනු ලැබූ දින" | "පිළිවෙළින් ඒ සුරකුම්පත් දෙනු ලැබූ දින" |
| 50 | 284(1) | "ගණන් බේරා වසා දැමීමේ ආඥාවක් කරනු ලැබූ" | "ගණන් බේරා වසා දැමීමේ ආඥාවක් කරනු ලැබූ" |
| 51 | 287 | "බලපැවැත්විය යුතු ය:-" | "බලපැවැත්විය යුතු ය:-" |
| 52 | 290 | "ගණන් බේරා වසා දැමීමේ ආඥාවක් කරනු ලැබූ අවස්ථාවක" | "ගණන් බේරා වසා දැමීමේ ආඥාවක් කරනු ලැබූ අවස්ථාවක" |

| | | | |
|---|---|---|---|
| 53 | 292(2)(ඇ) | “දේපළ තහනමට ගැනීමේ දී වස්තු භංගත්වයට පත් වූ හෝ බුන්වත් වූ තැනැත්තන්ගෙන් ලැබිය යුතු වෙනම ණයක් ලෙසත් වෙනමම වූ සෙසු ණය හිමියන් සමහ අනුපාතිකව, එකී ශේෂය සම්බන්ධයෙන්” | “දේපළ තහනමට ගැනීමේ දී වස්තු භංගත්වයට පත් වූ හෝ බුන්වත් වූ තැනැත්තන්ගෙන් ලැබිය යුතු ඒ ශේෂයෙන් වෙනම ම වූ ණය සම්බන්ධයෙන් සහ වෙනම ම වූ සෙසු ණයහිමියන් සමග අනුපාතිකව” |
| 54 | 292(2)(ඌ) | “කටයුතු ගණන් බේරා වසා දැමීම” | “කටයුතු ගණන් බේරා වසා දැමීම” |
| 55 | 296(4) | “නියමිත ගාස්තුව” | “නියමිත ගාස්තුව” |
| 56 | 298(1) | “අවසාන වාර්තාව ඔවුන් වෙත කරනු ලැබූ කල්හි ද” | “අවසාන වාර්තාව ඔවුන් වෙත කරනු ලැබූ කල්හි ද” |
| 57 | 298(3) | “සියලු බැඳීම්වලින් ඔහු නිදහස් කරනු” | “සියලු බැඳීම්වලින් ඔහු නිදහස් කරනු” |
| 58 | 299(1) | “වෙන් වශයෙන්” | “වෙන් වශයෙන්” |
| 59 | 324(1) | “මාස දොළහක් නොඉක්මවන” | “මාස දොළහක් නොඉක්මවන” |
| 60 | 326(2) | “දුරට හැර” | “දුරට හැර” |
| 61 | 328(1) | “පිළිබඳ අධිකාරයක්” | “පිළිබඳ අධිකාරයක්” |
| 62 | 352 | “අධිකරණ බලය පැවරීමේ කාර්යය සඳහා” | “අධිකරණ බලය පැවරීමේ කාර්යය සඳහා” |
| 63 | 358(11)(අ) | “කරන හෝ කිරීමට බලය දෙන” | “කරන හෝ කිරීමට බලය දෙන” |
| 64 | 373(4)(අ) | “එක් මාසයක කාලසීමාව” | “එක් මාසයක කාලසීමාව” |
| 65 | 377(6) | “බද්දෙහි, බදු දීමනාකරුගේ ප්‍රතිඥා” | “බද්දෙහි, බදු දීමනාකරුගේ ප්‍රතිඥා” |
| 66 | 387 | “මුද්දර ගාස්තුවලින් නිදහස් විය යුතු ය.” | “මුද්දර ගාස්තුවලින් නිදහස් විය යුතු ය.” |

| | | | |
|---|---|---|---|
| 67 | 389(3) | "අධිකරණ වෙත අභියාචනය" | "අධිකරණ වෙත අභියාචනය" |
| 68 | 396(3) | "භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා වෙත දැනුම්" | "භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා වෙත දැනුම්" |
| 69 | 404(5) | "විධිවිධානවලට අනුකූලව යෝජනා සකස් කළ යුතු ය." | "විධිවිධානවලට අනුකූලව යෝජනා සකස් කළ යුතු ය." |
| 70 | 414 (පැති සටහන) | "පත්වීමට එකඟත්වය" | "පත්වීමට එකඟත්වය" |
| 71 | 428(2) | "ලියාපදිංචි කළ යුතු ය." | "ලියාපදිංචි කළ යුතු ය." |
| 72 | 428(3) | "ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 16 සිට 22 දක්වා වූ වගන්තිවල" | "ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 16 සිට 22 දක්වා වූ වගන්තිවල" |
| 73 | 431(6) | "ඒ ඉඩම සම්බන්ධයෙන් වල සෘණ භාරය ලියාපදිංචි කර ඇත්නම් මිස," | "ඒ ඉඩම සම්බන්ධයෙන් වල සෘණ භාරය ලියාපදිංචි කර ඇත්නම් මිස," |
| 74 | 449(2)(අ) | "උකස් ලාභියාගේ එකඟත්වය ලබා ගැනීමට" | "උකස් ලාභියාගේ එකඟත්වය ලබා ගැනීමට" |
| 75 | 450(3)(ඇ) | "සපුරාලන ලෙස නියම කරනු ලැබිය හැකි" | "සපුරාලන ලෙස නියම කරනු ලැබිය හැකි" |
| 76 | 450(4) | "ක්‍රියා කිරීමෙන් වළකින" | "ක්‍රියා කිරීමෙන් වළකින" |
| 77 | 470(1) | "කාර්ය සඳහා" | "කාර්ය සඳහා" |
| 78 | 472(2) | "අභියාචනාධිකරණය" (එකී වචනය දැක්වෙන කවර වූ හෝ අවස්ථාවක) | "අධිකරණය" |
| 79 | 481(3) | "අගතියක් නොවිය යුතු ය." | "අගතියක් නොවිය යුතු ය." |

| | | | |
|---|---|---|---|
| 80 | 482 | "රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ දෙපාර්තමේන්තුවේ (එකී වචන දැක්වෙන කවර හෝ අවස්ථාවක)" | "රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ දෙපාර්තමේන්තුවේ" |
| 81 | 514(1) | "මේ පනත යටතේ පිහිටුවන ලද අරමුදලට බැර කරනු ලැබිය යුතු ය." | "මේ පනත යටතේ පිහිටුවන ලද අරමුදලට බැර කරනු ලැබිය යුතු ය." |
| 82 | 519(3)(ඇ) | "කාර්ය සඳහා ඇතිකරගත් හවුල් ව්‍යාපාරයකට;" | "කාර්ය සඳහා ඇතිකරගත් හවුල් ව්‍යාපාරයකට;" |
| 83 | පළමුවන උපලේඛනය 17(3) | "සියයට දහයකට නොඅඩු" | "සියයට දහයකට නොඅඩු" |
| 84 | පළමුවන උපලේඛනය 17(4) | "සියයට අසූ පහකට නොඅඩු" | "සියයට අසූ පහකට නොඅඩු" |
| 85 | පළමුවන උපලේඛනය 31(1) | "කලින් කල පත් කිරීම මණ්ඩලය විසින් කරනු ලැබිය හැකි ය." | "කලින් කල පත් කිරීම මණ්ඩලය විසින් කරනු ලැබිය හැකි ය." |
| 86 | හතරවන උපලේඛනය I වන කොටස 7 | "එක් එක් පූර්ව විභජන" | "එක් එක් පූර්ව විභජන" |
| 87 | හතරවන උපලේඛනය I වන කොටස 9 | "ඒ කොටස් හෝ ඍණ පත්‍ර" | "ඒ කොටස් හෝ ඍණ පත්‍ර" |
| 88 | හතරවන උපලේඛනය II වන කොටස 20(3)(ආ) (i) | "ඒකාබද්ධ වත්කම් හා බැරකම්" | "ඒකාබද්ධ වත්කම් හා බැරකම්" |
| 89 | හතරවන උපලේඛනය II වන කොටස 20(3)(ආ) (ii) | "වත්කම් සහ බැරකම්" | "වත්කම් සහ බැරකම්" |

| | | | |
|---|---|---|---|
| 90 | හතරවන උපලේඛනය II වන කොටස 22(1)(අ) | "කොටස් හෝ සෘණ පත්‍ර" | "කොටස් හෝ සෘණ පත්‍ර" |
| 91 | හතරවන උපලේඛනය II වන කොටස 22(2)(ආ) | "සංස්ථාපිත මණ්ඩලයට පාලිත සමාගම් ඇති" | "සංස්ථාපිත මණ්ඩලයට පාලිත සමාගම් ඇති" |
| 92 | පස්වන උපලේඛනය (අ) | "රැස්වීමේ" | "රැස්වීමේ" |
| 93 | පස්වන උපලේඛනය (ආ) | "වාර්තාවේ දිනයේ දී සිටින කොටස් හිමියන්" | "වාර්තාවේ දිනයේ දී සිටින කොටස් හිමියන්" |